තේ තතු

දෙවන කලාපය

ISSN - 1391-6785

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශණයකි

පලවෙනි කාණ්ඩය, දෙවෙනි කලාපය 2001 ජූලි - දෙසැම්බර්

# පාළු සිටුවීම

තේ වගාවක අස්වැන්න තීරණය වන ප්‍රබල සාධකයක් වන්නේ ඉඩමේ ඇති පැළ සංඛ්‍යාවයි. නොයෙක් හේතූන් මත පැළ මැරී යාමෙන් තේ ඉඩමක පාළු ඇතිවිය හැක. පාළු පැළ සංඛ්‍යාව වැඩිවන විට අස්වැන්න ඉබේම අඩු වී යයි. කෙටි කාලයක් තුළ නැවත වගා කිරීමට අදහස් කර නොමැති රිකිලි තේ ඉඩම් වලත්, අස්වැන්න අඩු බීජ තේ ඉඩම් වලත් පාළු සිටුවීමෙන් අස්වැන්න වැඩි කර ගත හැකියි.

දුර්වල වූ සහ මිය ගිය ගස් ඉවත් කර පස පුනරුත්ථාපනය කිරීමෙන් පසු, මෝසම් වැසි සමගම පාළු සිටුවිය යුතුය. තැනින් තැන පැල එක දෙක සිටුවීම හැරුණු කොට කුඩා ඉඩම් කට්ටි වශයෙන්ද (Block infilling) පාළු සිටුවිය හැකිය. පැල එක දෙක සිටුවන විට කප්පාදුව අවසන් වූ වහාම සිටුවීම වැදගත්වේ. කට්ටි ආකාරයට පාළු සිටුවීම, පැල වල වර්ධනය අතින් ගත් කළ වඩාත් සාර්ථක බව සඳහන් කළයුතුය.

වරින් වර මිය යන තේ පැළ වෙනුවට පාළු සිටුවීම කප්පාදුවකට වරක් (විශේෂයෙන් මුල් කප්පාදු චක්‍ර කිහිපයේදී) සිදුකල හැකිනම්, එය ඉතා වැදගත් වේ.

පාළු සිටුවීමේදී මාස 12, 16 හා 19 වයසැති පැල පිළිවෙලින් පහතරට, මැදරට හා උඩරට ප්‍රදේශ සඳහා භාවිතා කළ හැකිය. සෙ.මී. 30ක් උස හා සෙ.මී. 15 ක් පළල පොලිතීන් මළු භාවිතා කිරීමෙන් හොඳින් වර්ධනය වූ තවාන් පැලයක් සාදා ගත හැක. වළවල් සෙ.මී. 60 ක් ගැඹුරට සහ සෙ.මී. 30 ක් පළලට සාදා ගැනීම වඩාත් සුදුසුය. පැල සිටුවීමට මාස දෙකකට පමණ පෙර ඒවා කොම්පෝස්ට් හා මතුපිට පස් වලින් පුරවා තබන්න.

පාලු සිටුවීමේදී, වටපණු හානිය හෝ මුල් රෝග ඇතිනම් නිසි ප්‍රතිකාර ක්‍රම අනුගමනය කිරීමත්, නිර්දේශිත දිරිමත් ක්ලෝන භාවිතා කිරීමත්, අවශ්‍ය වේ. එසේම පැල ඉක්මනින් වර්ධනය කර ගැනීම සඳහා නිසි පරිදි පැල සඳහා නිර්දේශිත පොහොර (ටී 200 හා ටී 750) යෙදීමත්, නිසි කෘෂිකාර්මික පිළිවෙත් (රෝග/පළිබෝධ මර්ධනයද ඇතුළත්ව) අනුගමනය කිරීමත්, සිටවූ පැල වටේට ඇති පරිනත තේ වගාවේ වට අතු කපා දැමීමත්, තනි තනිව සිටවූ පාළු පැල අවුරුද්දක් යනතුරු හැඩ ගැස්සවීම පමා කිරීමත් වැදගත්ය.

කට්ටි වශයෙන් පාළු සිටුවීමේදී එකවර වැය වන මුදල අඩු බැවින්, එය මුළු ඉඩමේම නැවත සිටුවීමට වඩා වාසිදායකය.

ජයන්ත ද සිල්වා